# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1746/4 - 2012 පෙබරවාරි 21 වැනි අඟහරුවාදා - 2012.02.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී. 6/2001(III).

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ජේදය සමඟ කියවිය යුතු 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (ඈ) ජේදය, 16 වැනි වගන්තිය සහ 112 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදනු ලබන නියෝග.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 පෙබරවාරි මස 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2005 ඔක්තෝබර් මස 12 වැනි දින අංක 1414/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2005 රක්ෂණ මණ්ඩල නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වැනි නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :-

"2. පනත යටතේ රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට, රක්ෂණකරුවකු ලෙස ලියාපදිංචි වීමට අදහස් කරන යම් තැනැත්තකු, රුපියල් පන් ලක්ෂයක මුදලක් සහ ඒ මත අයවිය යුතු රජයේ බදු, ගාස්තු වශයෙන් මණ්ඩලයට ගෙවිය යුතු ය.";

(2) එහි 3 වැනි නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් නියෝගය ආදේශ කිරීමෙන් :-

"3. රක්ෂණකරුවෙකු විසින් -

(අ) ක්‍රියාත්මක වන පළමු ලිත් වර්ෂය සඳහා රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තිය වෙනුවෙන්, රුපියල් ලක්ෂයක මුදලක් ; සහ

(ආ) ක්‍රියාත්මක වන දෙවන ලිත් වර්ෂ ආරම්භයේ සිට සහ ඉන් පසුව -

(i) රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තිය වෙනුවෙන්, රුපියල් ලක්ෂ දෙකක මුදලක් ; හෝ

(ii) රක්ෂණ ව්‍යාපාරයේ එක් එක් පන්තිය වෙනුවෙන්, කලින් මුදල් වර්ෂයේ දළ ලිඛිත වාරික මුදලින් 0.075% ක් ;

යන මුදල් ප්‍රමාණ අතුරින් වඩා වැඩි මුදල,

මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.".

03 - 383

1A - G 015701 — 835 (2012/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.